R 9036
06 FEB 2019

# ව්‍යාපාර කමිටු වාර්තාව - කිරිදිඹය ව්‍යාපාරය
# නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය - වීරවිල

## 2018 දෙසැම්බර් මස 13 දින පෙ.ව.9.00 ව්‍යාපාර කමිටුව

**නිලධාරී සහභාගීත්වය**

**වාරිමාර්ග කළමනාකරණ අංශය**

1. ටී.කේ.සුනිල් මයා - නේවාසික ව්‍යාපාර කළමනාකරු
2. බී . සේනාරත්න - සංවර්ධන නිලධාරී
3. ඉෂාන් රසික වර්ණකුලසූරිය මයා - සංවර්ධන නිලධාරී
4. ඒ . පී.කේ. ඉන්දික මයා - සංවර්ධන නිලධාරී
5. එච්.එල්.දිමුතු ප්‍රසන්න මයා - සංවර්ධන නිලධාරී

**රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වය**

1. M.C.වීරක්කොඩි මයා - ස්ථානභාර කෘෂිකර්ම උපදේශක, බෙරලිහෙල
2. M.G.G.චින්තා නන්දනී මිය - ගො.සං.ප්‍ර.නිලධාරී, බඳගිරිය
3. B.A.N.චින්තක මයා - කළමනාකරු-ලංකා බැංකුව
4. K.S.N.කළුදුරගේ මයා - සංවර්ධන නිලධාරී– ලංකා බැංකුව
5. P.K.ජයසේකර මයා - ඉංජිනේරු සහකාර , තිස්සමහාරාම
6. P.M.මදුරජිව මයා - ඉංජිනේරු සහකාර , තිස්සමහාරාම
7. T.M.රූබසිංහ මයා - ඉංජිනේරු සහකාර , තිස්සමහාරාම
8. K.G.චන්ද්‍රදාස මයා - ව්‍යාපෘතිසම්බන්ධීකාර(PEISEIP) , තිස්සමහාරාම
9. M.D.S.M.මුදලිගේ මයා - ඉංජිනේරු සහකාර , තිස්සමහාරාම
10. D.S.වීරසිංහ මයා - ඉංජිනේරු සහකාර , තිස්සමහාරාම

**ගොවි නියෝජිතයන්**

1. රෝහණ මයා - ලේකම්, DC 08, 09 ගොවි සංවිධානය
2. S.ජාලියගොඩ මයා - සභාපති, වලදොර ජනතා ගො.ස.
3. S.H. විජේසිරි මයා - භාණ්ඩාගාරික, පූල්මුල්ල ගැමුණු ගො.ස.
4. සරත් සිංගප්පුලි මයා - සභාපති, ගැමුණු ගො.ස.
5. S .W.P.චමින්ද රෝෂන් මයා - සභාපති, ද/ඉ යාය 02 DC 06/07 ගො.ස.
6. D.අන්දරවීර මයා - සභාපති, බඳගිරිය 02 ගො.ස.
7. අතුල ගලප්පත්ති මයා - ලේකම් , වීරවිල DC 05 ගො.ස.
8. S.P. රංජිත් මයා - සභාපති, වීරවිල DC 04 ගොවි සංවිධානය
9. P.සුමතිපාල මයා - සභාපති, ද/ඉ යාය 05 DC 11,12,13 ගො.ස.
10. K.P.ඥානදාස මයා - සභාපති, තිස්සවැව පැරකුම් ගො.ස.
11. P.G.සෝමවංශ මයා - සභාපති, තිස්ස වැව සුහද ගොවි සංවිධානය
12. සුනිල් දළදාවත්ත මයා - ලේකම්, ද/ඉ යාය 02 DC 01, 02 ගොවි සංවිධානය
13. නිල් සිරිවර්ධන මයා - ලේකම්, සඳගිරි බෙදුම් ඇල ගො.ස.
14. E.විජයරත්න මයා - භාණ්ඩාගාරික, විහාරමහාදේවි ගො.ස.
15. S.H.කරුණාරත්න මයා - සභාපති, වීරවිල වැව DC 9,10 ගො.ස.
16. එස්.ඩී.ජේමදාස මයා - සභාපති, බැමිණියාව සුහද ගොවි සංවිධානය
17. V.G.පුෂ්පා මිය - සභාපති, දුටුගැමුණු ගො.ස.
18. D.G.ධම්මිකා නිශාන්ති මිය - භාණ්ඩාගාරික, සාලියපුර DC 6,7,8 ගො.ස.
19. K.P.ආනන්ද සුමනවීර මයා - සභාපති, ව/ඉ යාය 02 , DC 6,7,8 ගො.ස.
20. D. පතිරණ මයා - සභාපති, ද/ඉ යාය 02 DC 02 ගො.ස.
21. ලතා හෙට්ටිආරච්චි මිය - ලේකම්, තිස්සවැව DC 4,5 ගො.ස.
22. G. කරුණාරත්න මයා - සභාපති , DC 8,9 ගො.ස.
23. සනත් බන්දුහේවා මයා - භාණ්ඩාගාරික, තිස්ස උදාර ගොවි සංවිධානය
24. H.K. ප්‍රේමරත්න මයා - සභාපති, වීරවිල වැව රුහුණු ගො.ස.
25. K.K.සරත් මයා - සභාපති, ද/ඉ යාය 06 DC 01 ගො.ස.

26. සනත් වික්‍රමසිංහ මයා - භාණ්ඩාගාරික, බඳගිරිය අංක 01 ගො.ස.
27. M.A.මුණසිංහ මයා - සභාපති, යාය 01/02 ගොවි සංවිධානය
28. S.K.ටෙරින් පියසිරි මයා - ලේකම්, යාය 02 DC 05 ගො.ස.
29. H.A.ලසන්ත චන්දන මයා - ලේකම්, දිදුල DC 01 ගො.ස.
30. W.A.K.නන්දසේන - සභාපති, වීරවිල වැව DC 01 ගොවි සංවිධානය
31. T.M.මහින්ද මයා - සභාපති, ප්‍රගති ගො.ස.
32. P.H.G.ප්‍රේමානන්ද මයා - භාණ්ඩාගාරික, දෙබරහැල එක්සත් ගො.ස.
33. උපාලි අරඹගේ මයා - සභාපති, වීරවිල වැව DC 08 ගො.ස.
34. A.K. ආරියතිලක මයා - සභාපති, දෙබරවැව පුබුදු ගො.ස.
35. K.නිහාල් මයා - ලේකම්, ද/ඉ, යාය 1 DC 04 ගො.ස.

ව්‍යාපාර කළමනාකාරතුමා මුලසුන ගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ විය.ප්‍රථමයෙන්ම ආගමික වතාවත් වලින් අනතුරුව රැස්වීමේ අරමුණ පැහැදිලි කර දෙන ලදී.

ප්‍රථමයෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට මී උණ පිලිබඳව සභාව දැනුවත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.මී උණ වී වගාවට අදාළ ක්ෂේත්‍රයේ මාරාන්තික උණක් බවත් මෙය කුඹුරු වල වෙසෙන මීයන් නිසා බෝවන බවත් කුඹුරු වැඩ පටන් ගැනීමට පෙර සෑම ගොවි මහතෙකු විසින්ම සතියකට වරක් මී උණ සඳහා දෙනු ලබන පෙති දෙකක් පානය කිරීම අත්‍යාවශ්‍ය බව එතුමා එතුමා ගොවි නායකත්වය දැනුවත් කරමින් කියා සිටියේය.

ඉන් අනතුරුව පසු ගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම සිදුවිය.අඩු පාඩු කම් පෙන්වා දීමෙන් අනතුරුව එය සත්‍ය වාර්තාවක් බවට DC 11, 12, 13 ගෝ.සං.සභාපති G.සුමතිපාල මහතා යෝජනා කරන ලද අතර DC 4 සුහද ගොවි සංවිධානයේ ගරු සභාපති S.P.රංජිත් මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

පසුව සභාව අමතන ලද්දේ බඳගිරිය ගො.ජන සේ. ප්‍රා.නිලධාරීතුමියයි.එතුමිය කරුණු පැහැදිලි කරමින් කියා සිටියේ ගොවි ජනතාවට හිඟයකින් තොරව දැනට පොහොර නිර්දේශය ක්‍රියාත්මක බවයි.ගබඩා පහසුකම් අඩුවීම පොහොර ලබා දීමේ කටයුතු සඳහා බාධාවක් බව එතුමිය සඳහන් කලාය.

සිංගප්පුලි මහතා රු.1000 මුදලට වෙළඳපොලේ පොහොර මිලදී ගැනීමට නොමැති වීම ගොවි ජනතාවට ගැටළුවක් බව පැවසීය.තිස්ස වැව K.P.ඥානදාස මහතා ද මේ ගැන විමසීය.

ද/ඉ යාය 01 DC 03 සංවිධානයේ නිහාල් මහතා වල් ඌරන්ගෙන් වගාවන්ට ඇති තර්ජන ගැන ප්‍රශ්න කළේය.S.W.P.චමින්ද රෝෂන් මහතා ද පතිරන් මහතා ද තිස්ස උදාර සමිතියේ සනත් මහතා ද ජාලියගොඩ මහතා ද අනවසර රක්ෂිත ගොවීන්ට පොහොර ලබා දීම පිලිබඳව විවිධ කරුණු විමසීය.

ඉඩම් හිමි ප්‍රවේණිය වී බුසල් 18 දක්වා වැඩිකිරීමට එවා ඇති අලුත් චක්‍ර ලේඛණයට විරුද්ධව ගොවි ජනතාව නැගී සිටිය යුතු බවට S.P.රංජිත් මහතාද සුහද එක්සත් ගොවි සංවිධානයේ ගරු සභාපති G.G.සෝමවංශ මහතා ද DC 1,2,3 තිස්ස වැව පැරකුම් ගො.ස. K.P.ඥානදාස මහතා ද ගොවි ජනතාවගේ විරෝධය මේ ගැන දැක්වීමට ඉල්ලීමක් කළහ.

බඳගිරිය අංක 02 ගො.ස. ගරු සභාපති D.අන්දරවීර මහතා කරුණු දක්වමින් බඳගිරිය වැව දක්වා ඇති රතු කුරුස වැව , කරඹ වැව ආදී වැව් වලට ජලය ලබා දීම පිලිබඳව පැහැදිලි කිරීමක් කරන ලෙස ඉල්ලිය.

ඉන් අනතුරුව ව්‍යාපාර කමිටුව අමතන ලද්දේ තිස්සමහාරාම ලංකා බැංකුවේ කළමනාකාර මහතාය.ගොවි ජනතාවට ලංකා බැංකුවෙන් පහසු පොලියකට වගා ණය මුදල් ලබා දිය හැකි බවත් ණය ගෙවා ගැනීමට නොහැකි වූ අයට ද පහසුකම් සැලසීමට සූදානම් බවද එතුමා ප්‍රකාශ කළේය.

බෙරලිහෙල කෘෂිකර්ම උපදේශක M.C.වීරක්කොඩි මහතා ව්‍යාපාර කමිටුව අමතමින් මේ දිනවල ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දළඹු විශේෂයක් ගැන සභාවට කරුණු පැහැදිලි කළේය.මෙම දළඹුවා මුං ඇට වගාවට සහ බඩ ඉරිඟු වගාවට හානි කරන අතර ඉක්මණින් පැතිරී යන සත්ව විශේෂයක් බව කීය.

ව්‍යාපාර කළමනාකාරතුමා විසින් අප ව්‍යාපාර කමිටුව මගින් 17 18 19 20 යන දින යාමට නියමිත චාරිකාව පිලිබදව සභාවේ අවධානය යොමු කරන ලදී.එක් අයෙකු රු 1700/= මුදලක් කමිටු භාණ්ඩාගාරික මහතාට ගෙවිය යුතු බවද චාරිකාව පිලිබදව කාගේත් සහයෝගය වැදගත් බවද පැහැදිලි කරන ලදී.2018/12/17 වන දින උදේ 5.00 ට ලුණුගම්වෙහෙර මුල් ගල ලඟින් සුභ නැකතින් ගමන් ඇරඹෙන බව දැන්විය.

ගොවි සංවිධාන තරඟය පිලිබදව කරුණු පැහැදිලි කල ව්‍යාපාර කලමනාකාරතුමා ලකුණු ක්‍රමයක් මගින් සියලුම ගොවි සංවිධාන පෙළගස්වන බව කීය.ඊට අදාල පත්‍රිකාවක් කමිටු නියෝජිත මහත්වරුන් ට බෙදා දෙන ලදී.

ඉදිරි වර්ෂයේදී ගොවි සංවිධාන වලට විශේෂ පුහුණු පන්ති කීපයක් පැවැත්වීමට අදහස් කරන බවද ව්‍යාපාර කලමනාකාරතුමා පැවසීය.ආදායම් කළමනාකරණය, නායකත්ව පුහුණුව වාරි මාර්ග නීතිය ආදී ක්ෂේත්‍රයට අදාල වැදගත් උපදේශන පන්ති කිහිපයක් ඇති බව දැන ගන්නට ලැබිණි.

අනතුරුව ඉංජිනේරු සහකාර දිලිනි මහත්මිය වාරිමාර්ග ඉංජිනේරුතුමා නියෝජනය කරමින් ව්‍යාපාර කමිටුව අමතන්නට විය.

දැනට ලුණුගම්වෙහෙර ජලාශයේ අක්කර අඩි 183000 ඇති බවද ජලය පිලිබදව ගැටළුවක් ඉදිරියේදී ඇති නොවන බවද එතුමිය ප්‍රකාශ කලාය.

සහකාර ඉංජිනේරු මනෝජ් මහතා කරුණු පැහැදිලි කරමින් මිලියන 2000 ප්‍රතිලාභ ඉදිරි වර්ෂයේදී ලැබෙන බවත් ඉන් පන්නගමුවට මිලියන 200 ක් ද දෙබර වැවට මිලියන 200 ක් ද තිස්ස වැවට මි.300 ක් ද වම් ඉවුරට මි.300 ක් ද අනෙකුත් වැඩට මි.1000 ක් ද වැය වන බව ප්‍රකාශ කළේය.

උපාලි අරඹගේ මහතා :-

වීරවිල වැවේ ඇල මාර්ගය කි.මී. 18 ක් පමණ දිග බවත් දිගටම නඩත්තු කටයුතු ඇති බවද වීරවිල වැව වරාපිටිය වැව ගැන ද සොයා බැලිය යුතු බව කීය.තව දුරටත් ව්‍යාපාර කමිටුව ඇමතු උපාලි අරඹගේ මහතා මෙම කමිටුවේ ගරු ලේකම් E.A.විමලරත්න මහතාගේ දයාබර සොහොයුරෙකු වන E.A.ආරියදාස මහතාගේ හදිසි අභාවය පිලිබදව මෙම සභාව දැනුවත් කළේය.

සෝමවංශ මහතා :-

දිනෙන් දින අපට අහිමි වී යන වැව් රක්ෂිතය බේරා දිය යුතු බවත් හෝටල් සහ නිවාස ඉදි කිරීම් බහුලව සිදු වන බවත් ප්‍රකාශ කළේය.

බඳගිරිය අන්දරවීර මහතා:-

රතුකුරුස වැව,කරඹ වැව, රොට වැව ආදී වැව් පුළුල් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

ව්‍යාපාර කලමනාකාරතුමා විසින් නවතම පානීය ජල යෝජනා ක්‍රමය පිලිබදව සභාවට දැනුම් දෙන ලදී.මේ පිලිබදව ගොවි නායක මහත්වරු දීර්ඝ වශයෙන් අදහස් පල කරන්නට විය.තම තමන්ගේ යෝජනා පළමුව ඉටු කර දෙන ලෙස ඉල්ලීමක් ද කරන ලදී.

ජාලියගොඩ මහතා :-

මෙම යෝජනා ක්‍රමය තුලින් තිස්ස වැව දෙබර වැව සැකසී ඇති අතර පනිය ජල ප්‍රශ්නයක් නම් බෝතල් කල පානීය ජලය ලබා දීම මගින් මෙම ගැටළුවට විසදුමක් තිබෙන බවත් වගාවට ජලය අඩු වුවහොත් ඒක ප්‍රශ්නයක් වන බව පැවසීය.

වනසිංහ මහතා ද පතිරන් මහතා ද මෙහිදී අදහස් දැක්විය.

K.P.ඥානදාස මහතා , පන්නගමුව මහින්ද මහතා , සිංගප්පුලි මහතා , ද/ඉ සරත් මහතා තම තමන්ට ඇති ජල ගැටළු මුලින් විසදිය යුතු බව කියා සිටියහ.

උපාලි අරඹගේ මහතා:-
මෙම යෝජනාවට සමගාමීව විකල්ප යෝජනාවක් වශයෙන් උමා ඔයෙන් ජලය ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.
ජාලියගොඩ මහතා:-
මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට පළමුව පොදු ඇස්තමේන්තුවක් සකස් කල යුතු බවත්, පසුව යෝජනාවට නගමු ලෙසටත් අදහස් දැක්විය.
චමින්ද මහතා:-
පානීය ජලය ලබා දීම වැදගත් බවත් අපේ ගමට බොන්නවත් ජලය ලැබෙන්නේ නැතැයි පැවසීය.
මෙම පානීය ජල යෝජනා ව්‍යාපෘතිය ඉතා සංකීර්ණ ප්‍රශ්නයක් බවත් එය පමණක් වෙනත් දිනයක සාකච්ඡා කිරීම උචිත බවට ව්‍යාපාර කළමනාකාරතුමා සභාවට දැනුම් දෙන ලදී.
පලුගස්වැව දොර නැති බව ගලප්පත්ති මහතා ප්‍රකාශ කල අතර උඩුවිල වැව පාසි පිරී ඇති බව S.P.රන්ජිත් මහතා කිව්ය.රක්ෂිතය වෙන් කර දෙන ලෙස චමින්ද මහතා ඉල්ලීමක් කල අතර පතිරන මහතා ඇලවල නඩත්තු කටයුතු හා ඉදිකිරීම් කටයුතු කර දෙන මෙන් ඉල්ලීමක් කළේය.
ගොවි ප්‍රශ්නය විසදීමේදී තිස්ස වැව රුහුණු පුර ගොවි සංවිධානයේ තුෂාර මහතාට කිසියම් අපහසුතාවයක් ඇතිවීම පිලිබදව ද සභාවේ අවධානය යොමු විය.
වෙලාව ප.ව.2.30 ට පමණ ව්‍යාපාර කලමනාකාරතුමා මුලසුන දෙසුමෙන් හා ලේකම් මහතාගේ ස්තුතියෙන් පසු සභා තොමෝ සතුටින් විසිර ගියාය.

වී.කේ.සුනිල්
නේවාසික ව්‍යාපෘති
කළමණාකරු
කිරිදිඹය මහා වාරිමාර්ග ව්‍යාපාරය

A.K. ආරියතිලක
ලේකම්

පිටපත්:-

1. අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමණාකාර අංශය (කා:දැ:ස:)

2. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, හම්බන්තොට (කා: දැ:ස:)

3. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ( අන්තර් පළාත් ) හම්බන්තොට (කා: දැ:ස:)

4. ප්‍රාදේශීයලේකම්-තිස්සමහාරාම/ලුණුගම්වෙහෙර/හම්බන්තොට(කා: දැ:ස:)

5. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ ( දකුණු කලාපය) (කා: දැ:ස:)

6. වාරිමාර්ග ඉංජිනේරු, තිස්සමහාරාම (කා: දැ:ස:)

7. සහකාර අධ්‍යක්ෂ, කෘෂි රක්ෂණ මණ්ඩලය (කා: දැ:ස:)